**ශීර්ෂය - 228 අධිකරණ පරිපාලනය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 18 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කරතිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් **"බී"** ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබූ ශේෂ අනුව කේවල ණයශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂ අතර රු.13,031,920 ක වෙනසක් පැවතුණි. | අධිකරණ කලාප 08 ක කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුම අතර පවතින වෙනස්කම් මෙයට හේතු වී ඇති අතර, ඊට හේතු වූ කරුණු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස ද, එහි ප්‍රගතිය අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලෙස ද MOJ/AC/13/31/2024 දරන 2024.03.22 ලිපිය මඟින් අදාළ අධිකරණයන් වෙත දැනුම්දී ඇති බව දන්වා තිබුණි. | ණයශේෂ සසඳා වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබූ රු.1,736,759ක ප්‍රතිපාදන හා ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබූ රු.26,505,070 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය සියයට 17 සිට 93 දක්වා පරාසයක්ගෙන තිබුණි. | රාජ්‍ය වියදම් පාලනය පිළිබඳව චක්‍රලේඛය අනුගමනය කිරීම, හානි හා පාඩු කපා හැරීමට ඉදිරිපත් නොවීම ඉදිකිරීම් අපේක්ෂිත ප්‍රගතිය කරා ළඟා නොවීම, යන හේතු මත ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | නිසි අධ්‍යනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා වැය විෂයය අංක 2201 යටතේ ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී එම ආයතනය වෙනුවෙන් දරන ලද රු. 4,923,954 ක ප්‍රාග්ධන වියදම් දෙපාර්තමේන්තුවේ අංක 228–1–1–2001 දරන ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය යටතේ ගිණුම්ගතකර තිබුණි. | මෙම ගොඩනැඟිලි අලුත්වැඩියා නොකිරීමෙන් සිදුවිය හැකි ජීවිත අවධානම් හා දේපල අවධානම් වලක්වා ගැනීම සඳහා ඉතා කඩිනමින් මෙම ගොඩනැඟිලි අලුත්වැඩියාවන් කිරීම අත්‍යාවශ්‍යය කරුණක් වූ බැවින් ද, එහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණ අනුව මෙම ගෙවීම අමාත්‍යාංශයේ වැය විෂයය මඟින් සිදු කරන ලද බව දන්වා තිබුණි. | නිසි අධ්‍යනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන බැරකම් ලේඛනයේ ඇතුළත් වැය විෂයයන් 03 කට අයත් රු.124,590 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත්කර නොතිබුණි. | බැරකම් ලේඛනයේ සඳහන් මෙම වටිනාකම බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත්කර නොමැති අතර, ඉදිරියේදී එවැනි අතපසුවීම් සිදු නොවන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබාදුන් බව දන්වා තිබුණි. | සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු ය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | 104 | | 2023 වර්ෂයේ ජනවාරි හා ජුනි මාසවලදී අනතුරට ලක් වූ වාහන 02 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් වාර්තා ලබාදී නොතිබුණි | මෙම අනතුරට ලක් වූ වාහන 02 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ පරීක්ෂණ මණ්ඩල වාර්තා අවසන්කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | 109 (1) හා (2) | 7,137,718 | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය අනුව 2023 දෙසැම්බර් 31 දිනට සිදුවීම් 64 කට අදාළව තවදුරටත් හානි හා පාඩු අයකර ගැනීමට පැවතුණි. | මෙම අලාභ හානි බොහොමයක් වර්ෂ ගණනාවක් පැරණි ඒවා බැවින් පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව පවතින ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ඒ අනුව ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 396 | 18,641,987 | 2023 දෙසැම්බර් 31 දිනට මහාධිකරණ කලාප 26 කට අයත් බැංකු ගිණුම් 58 ක් තුළ නිකුත් කර ඇති මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | මාස 06 ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ.396 අනුව කටයුතු කරන ලෙස සියළුම කලාප මහාධිකරණ වෙත උපදෙස් ලබා දෙන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | | දෙපාර්තමේන්තුවට අයත් වාහන 71 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අධිකරණ විනිසුරු නිලරථවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීම ප්‍රායෝගිකව ඉතා අසීරු කාර්යයක් වන අතර, ඉදිරියේදී ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්ය නිමකර දින 10 ක් තුළ අතුරු අග්‍රිම නැවත පියවිය යුතු වුව ද, අවස්ථා 08 කදී රු.206,800ක් වූ අත්තිකාරම් එසේ නියමිත දින තුළ පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල් කාති අධිකරණවල කටයුතු සඳහා කොළඹින් බැහැරව යාමට ලබාගත් අත්තිකාරම් මුදල් වන අතර, කාර්යය අවසන් වූ වහාම ලබාගත් අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. | අතුරු අග්‍රිම නියමිත පරිදි පියවීමට කටයුතු කළ යුතු ය. |

**2.5 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහාධිකරණ කලාප 11 ක පොදු තැන්පතු ගිණුම් කාල විශ්ලේෂණයට අනුව වසර 05 කට වැඩි කාලයක් සහිතව තැන්පතු ගිණුමේ පවතින මුළු ඇප තැන්පතු ප්‍රමාණය රු.116,077,742 ක් ද, ටෙන්ඩර් තැන්පතු ප්‍රමාණය රු.649,173 ක් ද, තාවකාලිකව රැඳවුම් තැන්පතු | නිදහස් කිරීමට හැකියාව පවතින සියලු රැඳවුම් මුදල් නිදහස් කිරීමටත්, එසේ නොවන්නේ නම් මු.රෙ 571 ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | නිදහස් කළ හැකි තැන්පතු නියමිත පරිදි නිදහස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

රු.36,282,982 ක් සහ කොන්ත්‍රාත් රැඳවුම් රු.1,168,628 ක් ද විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහව දිසා මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීමට 2021 ඔක්තෝබර් මාසයේ පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී රු.6,820,384 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම්කර තිබුණ ද, 2022 නොවැම්බර් මාසය වන විට මුළු වියදම ලෙස රු.24,137,687 ක් දරා තිබුණු අතර, භෞතික ප්‍රගතිය සියයට 60 විය. 2022 දෙසැම්බර් මාසයේ පවත්වන ලද කමිටු රැස්වීමේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින ගැටලුකාරී තත්ත්වය අනුව මෙම ව්‍යාපෘතිය නතර කිරීමට තීරණය කර ගිවිසුම අවසන්කර තිබූ අතර, භෞතික ප්‍රගතිය සියයට 60 ක් විය. මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටුකර ගැනීමට නොහැකි වී ඇති අතර, දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. | මේ දක්වා කරන ලද ගෙවීම්වලට සරිලන වටිනාකමින් යුතුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කර ඇත. නැවත සුදුසු ලංසු ක්‍රමයක් ඔස්සේ ප්‍රසම්පාදනය සිදුකර සුදුසු කොන්ත්‍රාත්කරුවකු හරහා ඉතිරි වැඩ සිදු කිරීමට සැලසුම් කරමින් පවතින බව දන්වා තිබුණි. | ඉදිකිරීම් සැලසුම් කළ පරිදි අවසානකර එහි අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | කල්පිටිය අධිකරණ කාර්යාල ගොඩනැගිල්ල සහ ලේඛනාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් මාසයේදී පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගතවී රු.9,922,870 ක් අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර, ව්‍යාපෘතිය 2023 අගෝස්තු මාසයේ අවසන් කිරීමට නියමිතව තිබුණි. ඉදිකිරීම් සැලසුම් වෙනස්වීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලය 2023 සැප්තැම්බර් මාසයේ පවත්වන ලද කමිටු රැස්වීම අනුව ඉදිකිරීම් ආරම්භකර නොමැති බැවින්, ව්‍යාපෘතිය නවතා දැමීමට | රු.908,487 ක අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු බිල්පත් මඟින් අයකර ඇති අතර, ඉතිරි රු.9,014,382 ක මුදල ද, අයකර ගෙන ඇති බව දන්වා තිබුණි. | කොන්ත්‍රාත් ව්‍යාපෘති සඳහා රජයේ අරමුදල් ඵලදායීව උපයෝජනය කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | තීරණයකර, 2023 අගෝස්තු මාසයේදී ගිවිසුම අහෝසිකර, ඉතිරි අත්තිකාරම් මුදල් ලෙස රු.9,014,383 ක් කොන්ත්‍රාත්කරු ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය තුළින් රජයේ අරමුදල් වසර 1 ½ ක කාලයක් උපයෝජනය නොකිරීම මෙන්ම මූලික වියදම් වූ රු.908,487 ක් ද, නිෂ්කාර්ය බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) | කුලියාපිටිය දිසා අධිකරණයේ කාර්යාලය හා ලේඛනාගාරයේ උසාවි ශාලාව සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම් 2021 නොවැම්බර් මාසයේ අත්තිකාරම් මුදලක් ගෙවා, පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගතවී තිබුණු අතර, ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී සම්පූර්ණයෙන් අවසන් කිරීමට සැලසුම්කර තිබුණි. 2022 වර්ෂයේදී ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු බැවින්, දෙපාර්ශවයේ එකඟතාවය මත ව්‍යාපෘතිය නවතා දැමීමට 2023 වර්ෂයේ මාර්තු මාසයේ ගිවිසුම් ගතවී තිබුණු අතර, පෞද්ගලික ආයතනය වෙත ගෙවා තිබුණු රු. 11,163,922 ක අත්තිකාරම් මුදල එම ආයතනය විසින් මාස 15 ක කාලයක් නිෂ්කාර්යව තබා ගැනීමෙන් අනතුරුව 2023 මාර්තු මාසයේදී අමාත්‍යාංශය වෙත ගෙවා තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2022 අනුව 2022.09.15 වන දින පැවති වැඩ අවසන් කිරීමට නියමිත (Termination)) ව්‍යාපෘති සම්බන්ධ තීරණ ගැනීමේ කමිටු රැස්වීමේ තීරණය මත, මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බැවින්, කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ අත්තිකාරම් මුදල අය කරගෙන ඇති අතර, ගිවිසුම් ප්‍රකාරව දෙපාර්ශවයේ එකඟතාවය මත මෙම ව්‍යාපෘතිය නතර කිරීමට කටයුතුකර ඇති බව දන්වා තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබූ මුදල් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කොළඹ මහාධිකරණය විසින් ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ආයතන 07 කින් මිල ගණන් කැඳවීමට 2022 දෙසැම්බර් 15 දින ප්‍රසම්පාදන කමිටු අනුමැතිය හිමි වී තිබුණු අතර, තෝරාගන්නා ලද සැපයුම්කරුවන් සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය හිමි වී තිබුණේ 2023 අප්‍රේල් 24 වන දින ය. ඒ අනුව සුදුසු සැපයුම්කරුවකු තෝරාගැනීමේ කටයුතු වෙනුවෙන් මාස 04 ක කාලයක් වැයකර තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු නිශ්චිත කාලරාමුවක් තුළ සිදු කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කළ පරිදි නියමිත කාලය තුළ සිදු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 වර්ෂයේදී ලිපිද්‍රව්‍ය මිලට ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබාදෙන අයිතම ප්‍රමාණය ඉක්මවා කොළඹ මහාධිකරණය විසින් කොළඹ අධිකරණ කලාපය සඳහා අවස්ථා 02 කදී රු.3,395,888 ක ලිපි ද්‍රව්‍ය මිලට ගෙන තිබුණි. | අධිකරණ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා මෙම ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් සිදුකර ඇති අතර, ප්‍රසම්පාදන අනුමැතියෙන් පරිබාහිරව කිසිදු විටක මිලදී ගැනීම් සිදු නොකරන ලෙස අදාළ නිලධාරින් දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | ප්‍රසම්පාදනයන් අනුමත සීමාවන් තුළ සිදුකළ යුතු ය. |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහාධිකරණ 03 ක නිෂ්කාර්යය කාර්යාල උපකරණ පැවති අතර, ඒවායේ නිෂ්ක්‍රීය කාලය වසර 01 සිට වසර 08 දක්වා විහිදී තිබු අතර, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 767 පරිදි කටයුතු කර නොතිබුණි. | මු.රෙ 756 අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මඟින් නිශ්ක්‍රීය භාණ්ඩ ලෙස නිර්දේශ ලබාදී ඇත්නම් ඒ අනුව ද, පාවිච්චියට ගත හැකි නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් මු.රෙ.767(1) හා අදාළ කටයුතු කරන ලෙස අධිකරණ වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අධිකරණ සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් නියමිත පරිදි ඇප තැබිය යුතු වුව ද, මහාධිකරණ කලාප 11 ක නිලධාරීන් 65 දෙනෙකු රු.1,450,000 ක මුදලක් ඇප වශයෙන් තබා නොතිබුණි. | සියලු අධිකරණවල ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොමැති බැවින්, මේ වන විට අදාළ තොරතුරු කැඳවීම සඳහා සියලු අධිකරණ වෙත දැනුම් දීම සිදුකොට ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව නිලධාරීන්ගේ ඇප මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | පුත්තලම පළාත්බද මහාධිකරණයේ සේවයේ නියුතු නිලධාරීන් 14 දෙනෙකුගේ තැබිය යුතු ඇප මුදල් වෙනුවෙන් ඇප බැඳුම්කර ලියාපදිංචිය සඳහා අදාළ | අමාත්‍යාංශය වෙත යොමුකර තිබූ අයඳුම්පත් 2023.10.05 දිනැති ලිපිය මඟින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ සඳහා යොමුකර | ඇප බැඳුම්කර ලියාපදංචිය කඩිනමින් කළ යුතු ය. |

| | |
|---|---|
| තොරතුරු අධිකරණ අමාත්‍යාංශය වෙත එවා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී ඒවා අනුමත වී නොතිබුණි. | ඇති බව දන්වා තිබුණි. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් රජයට අයවිය යුතුව තිබෙන සියලුම ණය මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිත ඕනෑම මුදලකින් අඩු කරගැනීමට කටයුතු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂය රු. 3,427,799 ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු. 133,360 ක් ද, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු.214,110 ක් වශයෙන් ද පැවතුණි. | මියගිය නිලධාරින්ගේ අයවිය යුතු රු.3,427,799.33 ක් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා ණයශේෂ ලිපිගොනුවල අඩුපාඩු පවතින බැවින්, මෙම ණය අය කරගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නිරවුල්කර නොමැති අතර, මරණ පාරිතෝෂිකය ලබාගැනීමට ප්‍රතිලාභීන් ඉදිරිපත් නොවන අවස්ථාවලදී අත්තිකාරම් බී ගිණුමේ ණයශේෂය පමණක් පියවා ගැනීමට අවශ්‍ය ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කඩිනම් පියවරගන්නා ලෙස අදාළ අධිකරණ වෙත දැනුම්දී ඇති බව දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිත කල්හි ඔවුන්ගෙන් අයවිය යුතු ණය පිළිබඳ විස්තර දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත යොමුකර නිලධාරීන්ගේ පරිවර්තික විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදලින් අඩු කළ යුතු බව දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණයශේෂය රු.12,135,186ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ රු. 870,630 ක් ද, වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අය විය යුතු ණයශේෂ එකතුව රු.243,269 ක් ද විය. | විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අය වියයුතු රු.12,735,186 ක ණය ශේෂයෙන් රු.563,160 ක මුදලක් මේ වන විට නිරවුල් කරගැනීමට හැකි වී ඇත. ඉතිරි ණය ශේෂයන් ද නිරවුල්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, විවිධ හේතූන් මත විශ්‍රාම වැටුප හිමි නොවන නිලධාරීන්ගෙන් වාරික වශයෙන් ණය මුදල අයකරගැනීමට කටයුතු කරමින් පවතී. කෙසේ නමුත් විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණයශේෂ ප්‍රතිපාදන නිදහස් කළ වහාම පියවා ගැනීමට කඩිනමින් පියවරගන්නා ලෙස නිලධාරීන් දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 7.2.5 වගන්තිය ප්‍රකාරව වාහන ණය වර්ෂ 05 කට වරක් ලබාගත හැකි අතර, එසේ ලබාගැනීමේදී කලින් ලබාගත් වාහන ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන්කර තිබිය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර කොළඹ මහාධිකරණ කලාපයේ සේවයකර වැඩ තහනම්කර තිබූ රෙජිස්ට්‍රාර්වරයෙකුට මෝටර්රථ ණය හා බයිසිකල් ණය යන වර්ග දෙකම ලබාදී තිබීම නිසා ඔහුගෙන් රු.107,000ක් වූ මෝටර්රථ ණය හා රු.3,800 බයිසිකල් ණය අයවිය යුතු අතර, එම ශේෂ වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | මෙය වසර 15 කටත් වඩා පැරණි ණයශේෂයක් වන අතර, මහාධිකරණය වෙතින් විමසීමේදී ලිපිගොනු අංක කො/මහාධි/ගි/අත්ති බී/2021 දරන 2021.04.09 හා 2021.10.13 දිනැති ලිපි මඟින් අවධාරණයකර ඇත්තේ මේ නිලධාරියාගේ ණය අයකර ගැනීමට හෝ ඉදිරි කටයුතු කිරීම සඳහා වෙන කිසිඳු තොරතුරක් සොයාගත නොහැකි බවත්, මෙවැනි කල්ගත වූ ණයශේෂ සම්බන්ධයෙන් වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා MOJ/AC/13/39/2024 දරන 2024.04.19 දිනැති ලිපිය මඟින් අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණයශේෂය රු.370,235ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අය විය යුතු ණය ශේෂය රු.6,975 ක් ද, වසරකට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂය රු. 17,500 ක් ද විය. | රු.6,975 ක ණයශේෂ වසර 16 කට වඩා පැරණි බැවින් මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව කපා හැරීමටත් ඉතිරි ණයශේෂයන් 2024 වර්ෂයේ සිට අයවීමට නියමත බවත් දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඉ) | වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු ණයශේෂය රු.10,475,575ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු.1,375,612 ක් ද, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු.2,501,002 ක් ද, වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂය රු.1,363,611 ක් ද විය. | වැඩ තහනම් නිලධාරීන්ගේ විනය කටයුතු අවසන් වී නොමැති බැවින්, ණයශේෂ අයකර ගැනීමට අපහසු වී ඇති බවත්, බොහෝ අවස්ථාවලදී අදාළ නිළධාරීන් දැනුවත්කර මාසික වාරික වශයෙන් හෝ ණයශේෂය පියවා ගැනීමටත්, ඇපකරුවන්ගේ තොරතුරු පවතින අවස්ථාවලදී ඔවුන්ගෙන් ණය මුදල අයකර ගැනීමටත් කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් සිටින නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණයශේෂය රු.9,403,611 ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට අය විය යුතු ණයශේෂ එකතුව රු.344,468 ක් ද, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණය ශේෂ එකතුව රු.1,471,919 ක් | සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය මුදල් වහාම පියවීමට කටයුතු කරන මෙන් අදාළ මහාධිකරණ විසින් සේවය හැරගිය නිලධාරීන් වෙත දන්වා ඇති අතර, ඇපකරුවන් සිටී නම් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට දන්වා ඇත. ඒ අනුව ඇතැම් | ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ද, වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු.884,044 ක් ද වශයෙන් පැවතුණි. | නිලධාරීන් වාරික වශයෙන් ණය මුදල් පියවීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලුම්කර ඇති අතර, ඒ සඳහා මේ වන විට අදාළ අනුමැතීන් ලබාදී ඇති බවත් දන්වා තිබුණි. | |
| (උ) | මුදල් රෙගුලාසි 586(2) ප්‍රකාරව මහාධිකරණ විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනයට අනුව මහාධිකරණ 03 ක නඩු 60 කට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.7,545,500 ක දඩ මුදලක් දෙසැම්බර් 31 දින වන විට ද අයවිය යුතුව පැවතුණි. | අදාළ දඩ මුදල නියමිත දිනයේ නොගෙවන්නේ නම් සිර දඬුවම් ලබා දේ. දඬුවම් කාලය නිමවීමට පෙර දඩ ගෙවීම සිදු කරයි නම්, දඩ මුදල අය කරගත හැකි අතර, අදාළ දඩ මුදල නොගෙවන්නේ නම් ඒ සඳහා සිර දඬුවම නියම කරනු ලබන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඌ) | 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුළ ඉදිකිරීම් ව්‍යාපෘති 16 කට අදාළව කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදී තිබූ වැඩ අත්තිකාරම් වලින් රු.301,050,923 ක ශේෂයක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අය වී නොතිබුණු අතර, එහි ඇතුළත් ව්‍යාපෘති 03 කට අදාළව ලබාදී තිබූ රු.48,599,924 ක අත්තිකාරම් මුදලින් කිසිදු ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිවලට අදාළව අයවිය යුතු අත්තිකාරම් මුදල් ඒ ඒ ව්‍යාපෘතිවලට අදාළ බිල්පත් ගෙවීම් සිදු කිරීමේදී කර ඇති වැඩ වටිනාකම අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4. (iii) ප්‍රකාරව පිළිවෙලින් අයකිරීම් සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත ලබාදී ඇති මුදල් කඩිනමින් අයකර ගත යුතු ය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුව සඳහා අනුමත මුළු කාර්ය මණ්ඩලය 5256 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 4458 ක් වූයෙන් නිලධාරීන් 798 ක පුරප්පාඩු පැවතුණි. | මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ 01/2023 ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ රාජ්‍ය සේවයට බඳවාගැනීමට නොහැකි වී ඇති අතර, බඳවාගැනීම් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත්කර අනුමැතිය ලද තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාර්යාල සේවක, සිතාසි බෙදන්නන් හා ඇස්කිසි ක්‍රියාත්මක කරන්නන්, අධිකරණ ආරක්ෂක යන තනතුරුවල ඉහළ පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණු අතර, එම ප්‍රමාණයන් පිළිවෙලින් 455,192 හා 97 ක් වශයෙන් විය. | සිතාසි බෙදන්නා සහ ඇසිකිසි ක්‍රියාත්මක කරන්නා තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ලිඛිත පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවා ඇත. බඳවාගැනීම් පටිපාටිය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු එම බඳවාගැනීම් සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | පුරප්පාඩුව කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු ය. |